# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1955/5 – 2016 පෙබරවාරි 23 වැනි අඟහරුවාදා – 2016.02.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය – සාමාන්‍ය

## ආණ්ඩුවේ නිවේදන

මගේ අංකය: IR/COM/01/N/2014/71.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනත 4(1) වැනි වගන්තිය යටතේ නියෝගය**

මෙම නියෝගය අනුබද්ධිත කම්කරු කොමසාරිස්වරයාගේ ප්‍රකාශනයේ නියම කර දක්වා ඇති කාරණය පිළිබඳව –

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

01. ඒ. සුජේසන් මයා, ඥානසම්පත්තර් ලේන්, වඩිවුසවුත් වේල්ස්, වඩියුකොඩාල්.
02. ඊ. කේ. එස්. සේනාධීර මයා, අංක 31, නිව් සිටි ගඩබුවාන පාර, පිළියන්දල.
03. ඒ. පී. ගමගේ මයා, අංක 54, ශ්‍රී සුමංගල මාවත, ගංගමුව, බණ්ඩාරගම.
04. ඕ. සී. එන්. ජයවර්ධන මයා, බ්ලොක් 38, පෙර පාසල අසල, කොබෙයිතුඩුව, බටගල.
05. කේ. ඒච්. ජී. බී. නාලනී මිය, "පවන". නියාගම, තල්ගස්ගම.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්, අංක 21, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

අතර කාර්මික ආරාවුලක් පවතින හෙයින්ද,

කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍ය වේලාතන්තිරිගේ දොන් ජෝන් සෙනෙවිරත්න වන මම 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 04 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරාවුල් (විශේෂ ප්‍රතිපාදන) පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ, ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරාවුල බේරුම් කිරීමෙන් සමථයකට පත් කිරීම සඳහා බේරුම්කරු වශයෙන්, බොරලැස්ගමුව, පිරිවෙන පාර, අංක 128, එස්. විරිතමුල්ල මහතා පත්කර ඔහු වෙත මෙයින් යොමු කරනු ලැබේ.

ඩබ්ලිව්. ඩී. ජේ. සෙනෙවිරත්න,
කම්කරු හා වෘත්තිය සමිති සබඳතා අමාත්‍ය.

2016 පෙබරවාරි මස 16 වැනි දින,
කොළඹ දී ය.



*මෙම අති විශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

මගේ අංකය: IR/COM/01/N/2014/71.

**ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වැනි අධිකාරය වන කාර්මික ආරාවුල් පනත**
**(1956 ප්‍රතිශෝධිත මුද්‍රණය)**

*එක් පාර්ශ්වයක් වශයෙන්,*

01. ඒ. සුපේසන් මයා, ඥානසම්පත්තර් ලේන්, වඩිවුසවුත් වේල්ස්, වඩියුකොඩාල්.
02. ඊ. කේ. එස්. සේනාධීර මයා, අංක 31, නිව් සිටි ගඩඹුවාන පාර, පිළියන්දල.
03. ඒ. පී. ගමගේ මයා, අංක 54, ශ්‍රී සුමංගල මාවත, ගංගමුව, බණ්ඩාරගම.
04. ඕ. සී. එන්. ජයවර්ධන මයා, බ්ලොක් 38, පෙර පාසල අසල, කොබෙයිතුඩුව, බටගල.
05. කේ. ඒච්. ජී. බී. නාලනී මිය, "පවන". නියාගම, තල්ගස්ගම.

සහ

*අනෙක් පාර්ශ්වය වශයෙන්,*

ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ්, අංක 21, වොක්ෂෝල් වීදිය, කොළඹ 02.

ඉහත සඳහන් පාර්ශ්වයන් අතර ඇති **කාර්මික ආරාවුලට හේතු වී පවත්නා කරුණ වනුයේ,**

"ශ්‍රී ලංකා ඉන්ෂුවරන්ස් කෝපරේෂන් ලිමිටඩ් හි සේවය කරන ඒ. සුපේසන්, ඊ. කේ. එස්. සේනාධීර, ඒ. පී. ගමගේ, ඕ. සී. එන්. ජයවර්ධන, කේ. ඒච්. ජී. බී. නාලනී නැමති සේවක සේවිකාවන්ට 2010.11.05 දින සිට ශාඛා අලෙවි කළමානකරුවන් ලෙස උසස්වීම ලබාදීමේදී එතෙක් භුක්ති විඳි අන්තර් දීමනා, 01, ජීවන වියදම් ගැලපීමේ දීමනාව, ආහාර දීමනාව වැනි දීමනා අහිමි කිරීම යුක්තිසහගතද? යන්නත් එසේ යුක්ති සහගත නොවන්නේ නම් ඔවුන් වෙත ලබාදිය යුතු සහන කවරේද යන්නත් පිළිබඳව වේ."

**එම්. ඩී. සී. අමරතුංග,**
කම්කරු කොමසාරිස්.

2016 ජනවාරි මස 19 වැනි දින,
කොළඹ, කම්කරු කොමසාරිස් තැනගේ
කාර්යාලයේ දී දින යොදන ලදී.

03 – 196

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.